# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 71 දරන අධිකරණ
# සංවිධාන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 නොවැම්බර් මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 නොවැම්බර් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 45 යි | තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 71 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1931 නොවැම්බර් මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 11/81.

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.*

1. මේ පනත 1981 අංක 71 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

*1978 අංක 2 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.*

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 4 වන වගන්තියෙහි "දහසය දෙනකුට නොවැඩි වූ ද විනිශ්චයකාරවරයන් ගණනකින්" යන වචන වෙනුවට "විසි දෙනකුට නොවැඩි වූ ද විනිශ්චයකාරවරයන් ගණනකින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

'(1) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ පවුල් අධිකරණයක් වෙත පැවරී ඇති අධිකරණ බලය ක්‍රියාත්මක කරන විට "පවුල් අධිකරණයක්" ලෙස සැලකිය යුතු "දිසා අධිකරණයක්" ශ්‍රී ලංකාවේ එක් එක් අධිකරණ දිසාවෙහි විය යුතු අතර, සෑම අධිකරණ කොට්ඨාසයක ම "මහෙස්ත්‍රාත් අධිකරණයක්" සහ "ප්‍රාථමික අධිකරණයක්" විය යුතු ය. තව ද, ඒ එක් එක් අධිකරණය, පිළිවෙළින් "දිසා විනිශ්චයකාර සහ පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා", "මහෙස්ත්‍රාත්වරයා" සහ "ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයා" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු තැනැත්තකු විසින් තමා ඉදිරියේ පවත්වනු ලැබිය යුතු ය.'; සහ

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) සෑම දිසා විනිශ්චයකාර සහ පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු ද මහෙස්ත්‍රාත්වරයකු ද ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයකු ද ඒ අධිකරණයන්හි සියලු අතිරේක විනිශ්චයකාරවරයන් සහ මහෙස්ත්‍රාත්වරයන් ද ඔවුන්ගේ ධුරවලට, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.".

ශ 57778—14,550 (81/09)

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"අතිරේක විනිශ්චයකාර වරයන් පත් කිරීම යනාදිය.

8. (1) පිළිවෙළින් එකම දිසා අධිකරණයට, පවුල් අධිකරණයට, මහෙස්ත්‍රාත් අධිකරණයට සහ ප්‍රාථමික අධිකරණයට අතිරේක දිසා විනිශ්චයකාර සහ පවුල් අධිකරණ විනිශ්චයකාරවරයන්, අතිරේක මහෙස්ත්‍රාත්වරයන් හෝ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයන් අවස්ථානුකූලව අවශ්‍ය වන සංඛ්‍යාවක්, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) එකී යම් අධිකරණයකට පත් කරනු ලැබූ සෑම අතිරේක දිසා විනිශ්චයකාර සහ පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු ම, අතිරේක මහෙස්ත්‍රාත්වරයකු ම හෝ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයකුම, ඒ අතිරේක දිසා විනිශ්චයකාර සහ පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා, අතිරේක මහෙස්ත්‍රාත්වරයා හෝ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයා එසේ පත් කරනු ලැබ සිටින්නේ, අවස්ථාවෝචිත පරිදි යම් දිසාවක හෝ කොට්ඨාසයක පිළිවෙළින් වූ යම් දිසා අධිකරණයකට ද යම් පවුල් අධිකරණයකට ද යම් මහෙස්ත්‍රාත් අධිකරණයකට ද යම් ප්‍රාථමික අධිකරණයකට ද ඒ දිසා අධිකරණය, ඒ පවුල් අධිකරණය, ඒ මහෙස්ත්‍රාත් අධිකරණය සහ ඒ ප්‍රාථමික අධිකරණය වෙත පැවරී ඇති සියලු බලතල හෝ අධිකරණ බලය, වෙනම විනිශ්චයාසනාරූඪව ක්‍රියාත්මක කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියෙහි (2) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි "අභියාචනාධිකරණයේ සභාපතිවරයා විසින්" යන වචන වෙනුවට "අග්‍ර විනිශ්චයකාරවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ අතුරු විධානයේ "අභියාචනාධිකරණයේ සභාපතිවරයා සුදුසු යයි සලකතහොත්" යන වචන වෙනුවට "අග්‍ර විනිශ්චයකාරවරයා සුදුසු යයි සලකතහොත්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියෙහි "අභියාචනාධිකරණයේ සභාපතිවරයා විසින්" යන වචන වෙනුවට "අග්‍ර විනිශ්චයකාරවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "අනාචාරය සඳහා වන්දි ගෙවීම පිළිබඳ නඩු සම්බන්ධයෙන් ද නඩත්තු සහ දික්කසාද දීමනා සඳහා වූ ඉල්ලීම් සම්බන්ධයෙන් ද" යන වචන වෙනුවට "අනාචාරය සඳහා වන්දි ගෙවීම පිළිබඳ නඩු සම්බන්ධයෙන් ද දික්කසාද දීමනා සඳහා වූ ඉල්ලීම් සම්බන්ධයෙන් ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. 1979 අංක 37 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි, මෙයින් වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) එහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්—

'(1) සෑම අධිකරණ දිසාවකට ම "පවුල් උපදේශක" යනුවෙන් හඳුන්වනු ලබන නිලධරයකු විය යුතු ය.';

(ii) එහි (5) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්;

(iii) එහි (2) වන, (3) වන සහ (4) වන උපවගන්ති ඒ වගන්තියෙහි (3) වන, (4) වන සහ (5) වන උපවගන්ති ලෙස නැවත අංක යෙදීමෙන්; සහ

(iv) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(2) යම්කිසි නඩුවක පවුල් අධිකරණයක අධිකරණ බල සීමාව ඇතුළත වූ යම් කාරණයක් හෝ නඩත්තු දීමනා සඳහා වූ යම් ඉල්ලුම් පත්‍රයක් හෝ පිළිබඳ ආරාවුලක්, පරීක්ෂා කරනු ලැබීම හෝ විභාග කරනු ලැබීම පිණිස, අවස්ථාවෝචිත පරිදි දිසා විනිශ්චයකාර සහ පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු හෝ මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කර තිබෙන අවස්ථාවක, ඒ ආරාවුල පවුල් උපදේශකයකු වෙත යොමු නොකරන ලෙස ඒ නඩුවේ යම්කිසි පාර්ශ්වකරුවකු ලියවිල්ලකින් ඉල්ලීමක් කර ඇත්නම් මිස, ඒ දිසා විනිශ්චයකාර සහ පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ ආරාවුල පවුල් උපදේශකයකු වෙත යොමු කරනු ලැබිය යුතු අතර, ඒ පවුල් උපදේශක විසින්—

(අ) ඒ ආරාවුල සමථයකට පත් කර ගැනීම සඳහා පාර්ශ්වකරුවන් පෙළඹවීමට සෑම ප්‍රයත්නයක් ම දැරිය යුතු ය; තව ද

(ආ) දිසා විනිශ්චයකාර සහ පවුල් අධිකරණ විනිශ්චයකාර වරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලබන කාලසීමාව ඇතුළත දී, ඒ පිළිබඳව ස්වකීය වාර්තාව, අවශ්‍යාවෝචිත පරිදි ඒ දිසා විනිශ්චය කාර සහ පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** 1979 අංක 37 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත යටතේ නඩු පැවරීම සහ නඩු කටයුතු පවත්වාගෙන යාම පිළිබඳව, ඒ ආඥාපනතේ ඇති විධිවිධාන, පවුල් අධිකරණයෙහි පවරනු ලැබිය හැකි එවැනි නඩුවලට අදාළ වන්නේ යැයි සැලකිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ (4) වන උපවගන්තියෙහි "මහාධිකරණ විනිශ්චයකාරවරයකු, දිසා විනිශ්චයකාරවරයකු, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු හෝ මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි" යන වචන වෙනුවට, "මහාධිකරණ විනිශ්චයකාරවරයකු, දිසා විනිශ්චයකාර සහ පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු හෝ මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය, ඒ උපලේඛනයේ "(91 වන අධිකාරය වූ) නඩත්තු ආඥාපනත" යන විෂයය අත් හැරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනයෙහි (28) වන ඡේදය අත්හැරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අන්තර්කාලීන විධිවිධාන.

**14.** මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු ලබන දිනට ඉහතින් ම වූ දිනයෙහි, නඩත්තු දීමනා සඳහා වූ යම් ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් පවුල් අධිකරණවල විනිශ්චයට භාජනව පවතින සියලු නඩු කටයුතු උචිත මහෙස්ත්‍රාත් අධිකරණය වෙත භාර විය යුතු අතර, ඒ සියලු නඩු කටයුතු සංජානනය කිරීමට, විභාග කිරීමට හා තීරණය කිරීමට හෝ දිගට ම පවත්වාගෙන යාමට සහ නිම කිරීමට හෝ ඒ අධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය. තව ද, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු ලබන දිනයට පෙර ප්‍රකාශ කරන ලද නැතහොත් කරන ලද පෙර කී පවුල් අධිකරණවල නඩු තීන්දු සහ ආඥා, උචිත මහෙස්ත්‍රාත් අධිකරණය විසින් ප්‍රකාශ කරනු ලැබ තිබුණාක් මෙන් හෝ කරනු ලැබ තිබුණාක් මෙන් වලංගු හා බලසහිත විය යුතු ය.